ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලීය උපාධිධාරී වෘත්තීය දේශක එකමුතුව

Association of Professional Lecturers Graduated from USJP

# ජාතික ගිණුම්කරණය

කසුන් රාජපක්ෂ

*Coordinating Office*

**JMC Jayasekera Management Centre (Pvt) Ltd**

No 65/2A, Sir Chittampalam A Gardiner Mw, Colombo 02

Tel : 011 2 430451 | Mob : 071 4884 622 | 071 4150400 | Web : www.jmc.lk

**1. අ) ජාතික ගිණුම් යන්නෙන් කුමක් අදහස් වන්නේද?**

රටක නිෂ්පාදන ක්‍රියාවලිය තුළින්, නිමැවුම් ප්‍රවාහයක් ද, නිමැවුම් ප්‍රවාහය තුළින් ආදායම් ප්‍රවාහයක් ද, එම ආදායම භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට වියදම් කිරීමේදී වියදම් ප්‍රවාහයක් ද බිහි වන බැවින් නිෂ්පාදන, ආදායම් හා වියදම් යන ප්‍රවාහයන්ගේ වටිනාකම යම් කාලච්ඡේදයකට අදාලව මැන ඉදිරිපත් කිරීම ජාතික ගිණුම්කරණයේදී සිදු වේ.

**ඇ) කිසියම් රටක සමස්ත ආර්ථික ක්‍රියාවලිය මිනුම් කිරීම සඳහා භාවිතා කරන ප්‍රවේශ තුන කවරේද?**

1. ..............................................................................................................
2. ..............................................................................................................
3. ..............................................................................................................

නිෂ්පාදන ප්‍රවේශය ඔස්සේ මිනුම් කරනුයේ දෙන ලද වර්ෂය තුළ රටක් තුල නිෂ්පාදනය කරන ලද සියළුම අවසාන භාණ්ඩ හා සේවා වල වටිනාකම ය.

ආදායම් ප්‍රවේශය ඔස්සේ මනිනුයේ එම අවසාන භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා දායක වූ නිෂ්පාදන සාධක හෙවත් **ප්‍රාථමික යෙදවුම්** වලට කරන ලද මුළු ගෙවීම් ප්‍රමාණයේ හෙවත් **මුළු ප්‍රාථමික ආදායමේ** වටිනාකමය.

වියදම් ප්‍රවේශය ඔස්සේ මිනුම් කරනුයේ අවසාන භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා වැයකළ යුතු මුළු වියදමේ වටිනාකමයි.

**2. නිදසුන් දෙමින් පහත සංකල්ප පහදන්න**

**අ) ඵලදායී ආර්ථික ක්‍රියා හා ඵලදායී නොවන ආර්ථික ක්‍රියා**

- ඵලදායී ආර්ථික ක්‍රියා යනු භාණ්ඩයක් හෝ සේවාවක් බිහි කරන (එනම් ආර්ථිකයට නව වටිනාකමක් එකතු කරන ) ආර්ථික ක්‍රියා වේ. මේවායින් ඇතැම් ඵලදායී ක්‍රියා දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී සැලකිල්ලට ගන්නා අතර ඇතැම් ඒවා බැහැර කෙරේ.

- ඵලදායී නොවන ආර්ථික ක්‍රියා යනු භාණ්ඩයක් හෝ සේවාවක් බිහි නොකරන (එනම් ආර්ථිකයට නව වටිනාකමක් එකතු නොවන ) ආර්ථික ක්‍රියා වේ.මෙවැනි ආර්ථික ක්‍රියා , දළ දේශීය නිෂ්පාදිතයට ඇතුලත් නොවේ.

EX-

..................................................................................................................................................................................................
..................................................................................................................................................................................................
..................................................................................................................................................................................................
..............................................................................

**3. අ) නිෂ්පාදන ඉම යන සංකල්පය පහදන්න**

නිෂ්පාදන ඉම ( Production boundary) සංකල්පය භාවිත කරනුයේ ආර්ථික නිෂ්පාදන ක්‍රියාකාරකම් සහ ආර්ථික නොවන නිෂ්පාදන ක්‍රියාකාරකම් වෙන් කර අර්ථ දැක්වීමට යි. SNA – 2008 හි නිෂ්පාදන ඉම ඉතා පැහැදිලි ව විස්තර කරයි. ජාතික ගිණුම්කරණයේදී නිෂ්පාදකයන් මත නිෂ්පාදන ඉම අර්ථකථනය කර ඇත.

**නිෂ්පාදන ඉමට ඇතුලත් වන ආර්ථික ක්‍රියා**

**A. වෙළඳ පොල අරමුණු කරගත් නිෂ්පාදකයන්**

සිය නිමවුම් පිරිවැයෙන් සියයට 50කට වඩා වැඩි ප්‍රතිශතයකට එම භාණ්ඩ හෝ සේවා අලෙවිකර තම ආදායම ලෙස සටහන් කරන ආයතන මේ යටතට ගැනේ.

උදා - බොහෝ පෞද්ගලික ආයතන හා ඇතැම් රාජ්‍ය ආයතන

**B. වෙළඳපොල අරමුණු කර නොගත් නිෂ්පාදකයන්**

තම නිෂ්පාදනය නොමිලේ බෙදා හැරීම හෝ නිමැවුම් පිරිවැයෙන් සියයට 50කට අඩු මිලකට අලෙවි කිරීම සඳහා භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ නියුක්ත වූවන් වේ. මොවුන් ප්‍රධාන කොටස් දෙකකට බෙදේ.

**උදා -** ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක වලට සේවා සපයන ආයතන, **(රාජ්‍ය නොවන සංවිධාන,සමිති)** බොහෝ රාජ්‍ය ආයතන

**C. ස්ව පරිභෝජන නිෂ්පාදකයන්**

එනම් ස්ව පරිභෝජන අවශ්‍යතා සඳහා නිෂ්පාදන කටයුතු වල නියුක්ත වන ගෘහ ආර්ථික ඒකක හා වෙනත් ආයතන ව්‍යුහයන් මේ යටතට ගැනේ. මෙම නිෂ්පාදන සඳහා වෙළඳ පොළක් නොමැති වීම මෙහි ප්‍රධාන ලක්ෂණය වේ.

**උදා -** ගොවිතන් කටයුතු, වනාන්තර වලින් බෝග එකතු කිරීම , වනාන්තර වලින් දර කපා ගැනීම, මසුන් ඇල්ලීම, දඩයම් කිරීම, වළං සෑදීම , ඇඳුම් මැසීම , තමාගේම නිවස අලුත්වැඩියා කිරීම, තම නිවසෙන් ලබා දෙන නේවාසික සේවය

**නිෂ්පාදන ඉමට ඇතුලත් නොවන දෑ**

**A. ස්වයං සේවා**

ස්වයං සේවා යනු කුටුම්භය තුළ තමන්ගේම ශ්‍රමය යොදාගෙන ස්වකීය පරිභෝජනය උදෙසා සිදුකරන ක්‍රියාවන් වේ. මේවා ඵලදායී වුවද සංවිධානාත්මක වෙළඳ පොළක් තුල හුවමාරු නොවන බැවින් ජාතික ගිණුම් වලින් බැහැර කෙරේ.

**උදා -** නිවස පිරිසිදු කිරීම, ගෙවතු අලංකරණය , ආහාර පිළියෙල කිරීම, දරුවන් රැක බලා ගැනීම, පවුලේ සාමාජිකයන්ට ප්‍රවාහන සේවා සැපයීම, රැවුල කැපීම , ඉගනීම හා විවේකය

**B. මිනිස් ශ්‍රමයකින් තොරව වර්ධනය වන ස්භාවික සම්පත්**

උදා - විවෘත ජලාශයක මසුන් වැඩිවීම, ස්භාවික වනාන්තර වල මසුන් වැඩි වීම, වර්ෂා හා ගලා යන ජලය, ජලාශ වල ඇති ජලය

**4.** **දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී , ද්වි ගණන දෝෂ පැන නගින්නේ කෙසේද? එම දෝෂය නිවරදි කරන්නේ කෙසේද? පහදන්න**

ආර්ථිකයක සිදුවන ඵලදායී ආර්ථික කටයුතු වලින් **අවසන් භාණ්ඩ** (පාරිභෝගික භාණ්ඩ හා ප්‍රාග්ධන භාණ්ඩ) මෙන්ම **අතරමැදි භාණ්ඩ** ද බිහි වේ.

අවසාන භාණ්ඩ වල වටිනාකම තුල, අතරමැදි භාණ්ඩ වල වටිනාකමද ඇතුලත් වන බැවින් අතරමැදි නිෂ්පාදන හා අවසාන නිෂ්පාදිත යන දෙවර්ගයම එකට එකතු කළ විට එකම වටිනාකම දෙවරක් ගණනය වීම තුලින් ද්වී ගණන දෝෂ ඇති වේ. එනම් කිසියම් නිමැවුමක වටිනාකම දෙවරක් ගණනය කිරීම තුළ නිමැවුමේ ඇති වන දෝෂය ද්වී ගණන දෝෂය ලෙස හඳුන්වයි.මේ නිසා දළ දේශීය නිෂ්පාදිතය අධි තක්සේරු වේ යැයි සැලකේ.

දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී ද්වී ගණන දෝෂ වළක්වා ගත යුතුය. ඒ සඳහා ප්‍රවේශයන් දෙකක් යොදාගත හැකිය.

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

***Example -*** පාන් නිෂ්පාදන ක්‍රියාවලියකට අදාල පහත දැක්වෙන තොරතුරු සපයා ඇත. එම තොරතුරු ආශ්‍රයෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

| **භාණ්ඩ වර්ගය** (1) | **දළ නිමැවුම් වටිනාකම** (2) | **අතරමැදි යෙදවුම් වටිනාකම** (3) | **දළ එකතු කල වටිනාකම** (4 = 2 - 3) |
|---|---|---|---|
| තිරිඟු ඇට | 10 000 | | |
| තිරිඟු පිටි | 15 000 | | |
| බේකරි පාන් | 18 000 | | |
| අලෙවියට සූදානම් පාන් | 22 000 | | |
| | | | |

5. **අ) ශ්‍රී ලංකාවේ නිමැවුමේ වටිනාකම තක්සේරු කිරීමේදී භාවිතා කරන මිලයන් ස්වරූපයන් 3කි.කෙටියෙන් පහදන්න**

- **මූලික මිල (ප්‍රාථමික මිල)**

නිෂ්පාදකයාට නිමැවුම් ඒකකයක් සඳහ ලැබෙන මිල, මූලික මිල නම් වේ. එනම් නිෂ්පාදකයාට හිමිවන අයභාරයයි. භාණ්ඩය මත පනවනු ලබන නිෂ්පාදකයා විසින් ගෙවිය යුතු බදු මූලික මිලට ඇතුලත් නොවන අතර නිෂ්පාදකයාට ලබාදෙන සහනාධාර මෙම මිලට ඇතුලත් කෙරේ. ප්‍රවාහන ගාස්තු මූලික මිලට ඇතුලත් නොවේ.

- **නිෂ්පාදකයන්ගේ මිල**

මූලික මිලට භාණ්ඩය මත පනවනු ලබන ගෙවිය යුතු බදු එකතු කොට නිෂ්පාදකයාට ලැබෙන සහනාධාරය ඉවත් කළ පසු ලැබෙන අගය වේ.

- **ගැනුම්කරුවන්ගේ මිල (වෙළඳ පොළ මිල)**

එනම් ගැනුම්කරුවන් විසින් භාණ්ඩ ඒකකයක් සඳහා ගෙවන මිල වේ. මෙහිදී, නිෂ්පාදකයන්ගේ මිලට අතිරේකව ප්‍රවාහන ගාස්තු, වෙළඳ ආන්තිකයන් හා ගැනුම්කරුවන් ගෙවිය යුතු බදු ඇතුලත් කොට ගැනුම්කරුවන්ට ලැබෙන සහනාධාරයන් අඩු කල යුතුය.

**ආ) එකතු කල වටිනාකම් ක්‍රමය යටතේ රටක දේශීය නිෂ්පාදිත ගණනය කළහැකි ආකාරය නිදසුනක් මඟින් ඉදිරිපත් කරන්න**

එකතු කළ වටිනාකම් ක්‍රමයට දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී කෘෂි කාර්මික, කාර්මික හා සේවා යන සියළු අංශ වල එකතු කළ වටිනාකම් වල එකතුව පදනම් කර ගනී. එකතු කල මිල ගණනය කරනුයේ **මූලික මිල මතය.** මෙය **මූලික මිලට සමස්ත (දළ ) එකතු කල අගය** ලෙස හඳුන්වයි.

.................................................................................................................................................................

.................................................................................................................................................................

.................................................................................................................................................................

.................................................................................................................................................................

.................................................................................................................................................................

.................................................................................................................................................................

.................................................................................................................................................................

.................................................................................................................................................................

.................................................................................................................................................................

.................................................................................................................................................................

6. අ) වෙළඳ පොළ මිලට දල දේශීය නිෂ්පාදිතය හා දල ජාතික ආදායම යන සංකල්ප අතර වෙනස පහදන්න

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

**<u>දළ ජාතික ආදායම</u>** යනු කිසියම් කාල සීමාවක් තුල රටක නේවාසිකයන්ට හිමි නිෂ්පාදන සම්පත්, නිෂ්පාදනය සඳහා යෙදවීමෙන් බිහි වන සියළුම සාධක ආදායම් වල එකතුවයි.

7. **කිසියම් ආර්ථිකයක නිශ්චිත වර්ෂයක් පිළිබඳව කල්පිත සංඛ්‍යා දත්ත මාලාවක් ඔබට ඉදිරිපත් කොට ඇත. (රු.බි)**

මූලික මිලට සමස්ත එකතු කල අගය 5 000

භාණ්ඩ හා සේවා මත අය කරන බදු -සහනාධාර 600

විදේශ ප්‍රාථමික ආදායම් ලැබීම් 200

විදේශ ප්‍රාථමික ආදායම් ගෙවීම් 300

ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය 200

**I. වෙළඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය**

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

**II. දළ ජාතික ආදායම**

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

**III. ශුද්ධ ජාතික ආදායම**

.............................................................................................................................................

.............................................................................................................................................

.............................................................................................................................................

**8.** **අ) ස්ථාවර මිලට දළ දේශීය නිෂ්පාදිතය යනු කුමක්ද? එය පවත්නා මිලට දළ දේශීය නිෂ්පාදිතයෙන් වෙනස් වන්නේ කෙසේද?**

................................................................................................................................................................................................
................................................................................................................................................................................................
................................................................................................................................................................................................
................................................................................................................................................................................................

පවත්නා මිලට දළ දේශීය නිෂ්පාදිතය යනු යම් නිශ්චිත කාලපේදයක් තුල නිපදවන භාණ්ඩ හා සේවා වල වටිනාකම, එම කාලච්පේදයෙහි පවතින මිල ගණන් යටතේ තක්සේරු කිරීමෙන් ලැබෙන වටිනාකමයි. මේ තුල මිල මට්ටමේ වෙනස්වීම හා මූර්ත වෙනස්වීම් ද ඇතුලත් වේ.

**ඇ) දළ දේශීය නිෂ්පාදිතයේ ගම්‍ය අවධමනකය ගණන් බලන්නේ කෙසේද? එහි වැදගත්කම පහදන්න**

................................................................................................................................................................................................
................................................................................................................................................................................................
................................................................................................................................................................................................
................................................................................................................................................................................................

# ආදායම් ප්‍රවේශය

**1.** **අ) දළ දේශීය නිෂ්පාදිතය , ආදයම් ප්‍රවේශයට අනුව ගණනය කිරීමේදී ඇතුලත් කරන සංරචක මොනවාද?**

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

මෙහි පවතින ප්‍රාථිම ආදායම් අතරින් **ශුද්ධ මෙහෙයුම් අතික්තය, ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය හා මිශ්‍ර ආදායම්** යනාදියේ එකතුව <u>දළ මෙහෙයුම් අතික්තය</u> ලෙස හඳුන්වයි.

**ඇ) ආදායම් ප්‍රවේශයට අනුව වෙළඳ මිලට දළ ජාතික ආදායම ගණනය කරන ආකාරය පහදන්න**

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

**2. ආදායම් ප්‍රවේශයට අනුව දල දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේදී පහත දෑ අතරින් කවරක් ඇතුලත් කරන්නේද? කවරක් බැහැර කල යුතුද? යන්න පහදන්න**

**I.** රඳවා ගත් සමාගමික ලාභ

..........................................................................................................................................

**II.** විශ්‍රාම වැටුප් දීමනා

..........................................................................................................................................

**III.** ගුරුවරයෙකුගේ වැටුප

..........................................................................................................................................

**IV.** නිවාස කුලිය

..........................................................................................................................................

**V.** සේවක අර්ථසාධක අරමුදලට සේවා යෝජකයාගේ දායක ගෙවීම්

..........................................................................................................................................

**VI.** මූල්‍ය ප්‍රාග්ධනයට ලද පොලිය

..........................................................................................................................................

**VII.** ධීවරයෙකුගේ ශුද්ධ ආදායම

..........................................................................................................................................

**VIII.** සමෘද්ධි දීමනාව

..........................................................................................................................................

**IX.** කොටස් ලාභාංශ

..........................................................................................................................................

**X.** පුද්ගල ආදායම් බදු

..........................................................................................................................................

3. **පහත ආර්ථික දත්ත ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිලිතුරු සපයන්න** (වටිනාකම රු. බිලියන වලිනි)

සේවක ආදායම් 50,000

ස්වයං රැකියා ශුද්ධ ආදායම් 14 000

බදු කුලී ආදායම් 12 000

සාමාගමික ලාභ 22 000

ශුද්ධ විදේශ ප්‍රාථමික ආදයම් (5000)

ශුද්ධ පොලී ආදායම් 15 000

භාණ්ඩ හා සේවා මත බදු අඩු කල පසු සහනාධාරය 9 000

ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය 6 000

ගොවීන්ගේ ශුද්ධ ආදායම් 8 000

නිෂ්පාන වෙනත් බදු අඩු කළ පසු සහනධාරය 4 000

අවශ්‍ය වන්නේ

I. **ශුද්ධ මෙහෙයුම් අතිරික්තය**

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

II. **දල මෙහෙයුම් අතිරික්තය**

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

III. **වෙළඳ මිලට දල දේශීය නිෂ්පාදිතය**

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

IV. **වෙළඳ මිලට දළ ජාතික ආදායම**

......................................................................................................................................................

......................................................................................................................................................

......................................................................................................................................................

..........................................................................................................................................................................................................

..........................................................................................................................................................................................................

..........................................................................................................................................................................................................

**4. පහත තොරතුරු ඇසුරින් වෙළඳ මිලට ශුද්ධ ජාතික ආදායම හා වැයකල හැකි පෞද්ගලික ආදායම ගණනය කරන්න**

| | | |
|---|---|---|
| සේවක ආදායම් 400 | පෞද්ගලික බදු 310 | ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම් -40 |
| ගොවීන්ගේ ශුද්ධ ආදායම් 27 | ශුද්ධ පොලී 38 | රජයේ සංක්‍රාම ගෙවීම් 240 |
| සමාගමික බදු 40 | නොබෙදූ ලාභ 15 | ස්වයං රැකියා ශුද්ධ ආදායම් 30 |
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය 60 | භාණ්ඩ හා සේවා මත අය කල බදු (අඩු කලා සහනාධාර ) 20 | |

නිෂ්පාදනය මත වන වෙනත් බදු (සහනාධාර අඩු කිරීමෙන් පසු) 100

- **වෙළඳ මිලට ශුද්ධ ජාතික ආදායම**

..........................................................................................................................................................................................................

..........................................................................................................................................................................................................

..........................................................................................................................................................................................................

..........................................................................................................................................................................................................

..........................................................................................................................................................................................................

..........................................................................................................................................................................................................

..........................................................................................................................................................................................................

..........................................................................................................................................................................................................

..........................................................................................................................................................................................................

..........................................................................................................................................................................................................

..........................................................................................................................................................................................................

..........................................................................................................................................................................................................

..........................................................................................................................................................................................................

..........................................................................................................................................................................................................

..........................................................................................................................................................................................................

- **පෞද්ගලික ආදායම**

..........................................................................................................................................................................................................

..........................................................................................................................................................................................................

..........................................................................................................................................................................................................

..........................................................................................................................................................................................................

..........................................................................................................................................................................................

..........................................................................................................................................................................................

..........................................................................................................................................................................................

..........................................................................................................................................................................................

..........................................................................................................................................................................................

..........................................................................................................................................................................................

..........................................................................................................................................................................................

..........................................................................................................................................................................................

..........................................................................................................................................................................................

..........................................................................................................................................................................................

..........................................................................................................................................................................................

- **වැයකල හැකි පෞද්ගලික ආදායම**

..........................................................................................................................................................................................

..........................................................................................................................................................................................

..........................................................................................................................................................................................

..........................................................................................................................................................................................

# වියදම් ප්‍රවේශය

වියදම් ප්‍රවේශය තුල දී කිසියම් කාල පරිච්ජේදයක් තුළ නිපදවන ලද අවසාන භාණ්ඩ හා සේවා මිලට ගැනීම සඳහා කරන ලද වියදම මත සමස්ථ නිමැවුම අගය කිරීම සිදුවේ.

**1. දල දේශීය නිෂ්පාදිතය මිනුම් සඳහා ඇතුලත් කරන වියදම් හතර කවරේද? ඒවා කෙටියෙන් පහදන්න**

..........................................................................................................................................................................................

..........................................................................................................................................................................................

..........................................................................................................................................................................................

..........................................................................................................................................................................................

- පෞද්ගලික පරිභෝජනය යනු කුටුම්භයන් තම පරිභෝජනය සඳහා මිලදී ගැනීම් හා ලාභ අරමුණින් තොරව කුටුම්භ වෙත සේවා සපයන ආයතන කුටුම්භ සඳහා කරන මිලදී ගැනීම් වල එකතුවයි.

- දළ ආයෝජනය හෙවත් දළ ප්‍රාග්ධන සම්පාදනය යනු, කිසියම් කාලසීමාවක් තුළදී ස්ථාවර වත්කම් අත්පත්කර ගැනීම සඳහා දරනු ලබන වියදම් හා තොග වෙනස්වීම් හා වටිනාකමේ වෙනස්වීම් ආදියේ එකතුවයි.

- මධ්‍යම රජය හෝ එහි උප ආයතනයක් එනම් පළාත් සභා, නගර සභා , ප්‍රාදේශීය සභා විසින් භාණ්ඩ හා සේවා මත දරන සියළුම වර්තන වියදම් පොදු පරිභෝජනයට ඇතුලත් වේ.

- ශුද්ධ අපනයන යනු භාණ්ඩ හා සේවා අපනයන හා ආනයන අතර වෙනසයි.

## 2. පහත සංකල්ප අතර වෙනස පහදන්න

### I. කුටුම්භ අවසන් පරිභෝජනය හා සත්‍ය සුනිශ්චිත පරිභෝජන වියදම

✓ භාණ්ඩ හා සේවා අත්පත් කර ගැනීම සඳහා මුදලින් දරණ වියදම **කුටුම්භ අවසන් පරිභෝජන වියදම** ලෙස හඳුන්වයි.

✓ එසේම, මුදල් වියදම් කරන්නේ කවුරුන්ද යන්න නොසලකා භාණ්ඩ හා සේවා අත්පත් කර ගැනීමට දරණ වියදම **සත්‍ය සුනිශ්චිත පරිභෝජන වියදම** නම් වේ. මෙ සඳහා කුටුම්භ විසින් ගත් භාණ්ඩ හා සේවා හා කුටුම්භ සඳහා ගත් භාණ්ඩ හා සේවා යන දෙවර්ගයම මෙහි ඇතුලත් වේ.

**කුටුම්භ සත්‍ය සුනිශ්චිත පරිභෝජන වියදම =**

### II. රජයේ අවසන් පරිභෝජන වියදම හා රජයේ සත්‍ය සුනිශ්චිත පරිභෝජන වියදම

- මධ්‍යම රජය හෝ එහි උප ආයතනයක් විසින් අවසාන භාණ්ඩ හා සේවා මත දරන සියළුම වර්තන වියදම් අවසන් පොදු පරිභෝජනයට ඇතුලත් වේ.
- රජයේ සමස්ත අවසන් පරිභෝජන වියදමින් කුටුම්භ සඳහා ද්‍රව්‍යමය සංක්‍රාම ස්වරූපයෙන් සපයන ලද පුද්ගල පරිභෝජන භාණ්ඩ හා සේවා සඳහා දරණ ලද වියදම් අඩු කල පසු රජයේ සත්‍ය සුනිශ්චිත පරිභෝජන වියදම ලබා ගත හැක.

රාජ්‍ය සත්‍ය සුනිශ්චිත පරිභෝජන වියදම =

**3. පහත සංකල්ප අතර වෙනස පහදන්න**

**i. දළ දේශීය වියදම හා වෙළඳ පොල මිලට දළ දේශීය නිෂ්පාදිතය**

**දළ දේශීය වියදම** යනු යම් කාලපරිච්ඡේදයක් තුල රටක වැසියන් විසින් එම ආර්ථික කලාපය තුල පෞද්ගලික පරිභෝජනය, පොදු පරිභෝජනය හා දළ ආයෝජනය සඳහා කරනු ලබන වියදම් වල එකතුව වේ.

...........................................................................................................................

...........................................................................................................................

...........................................................................................................................

...........................................................................................................................

**වෙළඳ පොල මිලට දළ දේශීය නිෂ්පාදිතය** යනු යම් කාලපරිච්ඡේදයක් තුල රටක ආර්ථික ප්‍රදේශය තුළදී නිපදවන ලද අවසාන භාණ්ඩ හා සේවා මිලදී ගැනීමට දැරූ සමස්ථ වියදමයි.

දළ දේශීය නිෂ්පාදිතය මත වියදම ලබා ගැනීම සඳහා දළ දේශීය වියදමින් ආනයන වියදම් අඩු කොට එහි ඇතුලත් නොවූ අපනයන වියදම එකතු කළ යුතුය.එනම් ශුද්ධ අපනයන ගැලපිය යුතුය.

**ii. දළ ජාතික ආදායම හා වැයකළ හැකි දළ ජාතික ආදායම**

- වෙළඳ මිලට ගණනය කරන ලද දළ දේශීය නිෂ්පාදිතයට, ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම් ගැලපීමෙන් පසු ලැබෙන සමස්ත අගය **දළ ජාතික ආදායම** නම් වේ.

- ..........................................................................................................................................................
..........................................................................................................................................................
..........................................................................................................................................................

### iii. මුළු සම්පත් හා සම්පත් උපයෝජනය

★ **මුළු සම්පත්** යනු යම් නිශ්චිත අවස්ථාවක දී කිසියම් ආර්ථිකයක ප්‍රයෝජනයට ගත හැකි භාණ්ඩ හා සේවා වල වටිනාකමයි. ඒ සඳහා පහත මූලාශ්‍ර බල පානු ලබයි.

01.පවත්නා වෙළඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය

02.භාණ්ඩ හා සාධක නොවන සේවා ආනයනය

★ **සම්පත් උපයෝජනය** යනු ආර්ථිකයන් සතු එම මුළු සම්පත් ප්‍රමාණය එම රට විසින් භාවිතයට ගන්නා ආකාරයයි.සම්පත් උපයෝජනය කොටස් තුනකින් සමන්විත වේ.

01.මුළු පරිභෝජන වියදම **(පෞද්ගලික පරිභෝජන වියදම (C) + පොදු පරිභෝජන වියදම (G) )**

02.දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය **(දළ ආයෝජනය) (I)**

03.භාණ්ඩ හා සාධක නොවන සේවා අපනයනය **(X)**

**මෙම සංකල්ප සමාන වනුයේ,**

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

### iv. දේශීය ඉතුරුම් හා ජාතික ඉතුරුම්

**දේශීය ඉතුරුම්**

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

**ජාතික ඉතුරුම්**

.......................................................................................................................................................................

.......................................................................................................................................................................

.................................................................................................................................................................................................

.................................................................................................................................................................................................

**4. ජාතික ගිණුම්කරණයේ ප්‍රයෝජන/ වාසි මොනවාද?**

- ආර්ථිකයේ කාර්ය සාධනය ඇගයීමට යොදා ගැනීම.
- ආර්ථික වෘද්ධිය මැනීම.
- ඒක පුද්ගල ජාතික නිෂ්පාදිතය ඇස්තමේන්තු කිරීම.
- ආර්ථිකයේ ව්‍යුහමය ලක්ෂණ අනාවරණය කර ගත හැකි වීම.
- කාර්යාත්මක ආදායම් ව්‍යාප්තිය අනාවරණය වීම.
- අන්තර්ජාතික සංසන්දනයන් සඳහා භාවිත කළ හැකි වීම.
- ආර්ථික කාරක අතර ශ්‍රිතාත්මක සම්බන්ධතා හඳුනා ගත හැකි වීම.
- සම්පත් සංයුතිය හා උපයෝජනය අනාවරණය වීම.
- ආර්ථික කළමනාකරණය සඳහා තොරතුරු ලබා ගත හැකි වීම.
- සාර්ව ආර්ථික විචල්‍යයන්ගේ හැසිරීම පුරෝකථනය කළ හැකි වීම.

**5. ජාතික ගිණුම්කරණයේ සීමාවන් මොනවාද?**

- ආර්ථිකයේ ඇතැම් ඵලදායි ගනුදෙනු ජාතික ගිණුම්කරණයේ දී ඇතුළත් නොකෙරේ. ඒවා නම්,
    - ➢ ගෘහ ඒකකය තුළ සිදු වන භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාකාරකම් ජාතික ගිණුම් සඳහා ඇතුළත් කළ ද ගෘහ ඒකකයේ සාමාජිකයන් තමන්ගේ ම පෞද්ගලික පරිභෝජනය සඳහා ඉටු කරනු ලබන සේවා ආර්ථික

නිෂ්පාදන ක්‍රියා ලෙස නොසලකන බැවින් ජාතික ගිණුම් සඳහා ඇතුළත් නොකෙරේ. (ගෙවීමකින් තොර ව නිවස තුළ ඉටු කරනු ලබන සේවා)

- ගෘහණියන්ගේ සේවය ජාතික ගිණුම්වලට ඇතුළත් නොවීම.
- නොවිධිමත් ආර්ථිකය තුළ සිදුවන ඵලදායී නිෂ්පාදන ජාතික නිෂ්පාදිතයට ඇතුළත් නොවීම.
- නිෂ්පාදනය හේතුවෙන් පාරිසරික සම්පත්වලට සිදුවන හානිය සැලකිල්ලට නොගැනීම.
- රාජ්‍ය සේවා වල ඵලදායීතාවයේ ඇති වන වෙනස් වීම් සැලකිල්ලට නොගැනීම.
- විවේකයෙන් පුද්ගලයන් ලබන සතුට ජාතික ගිණුම් තුළ ඇතුළත් නොවීම.
- රාජ්‍ය ණය පොලී ජාතික නිෂ්පාදිතය ගණනය කිරීමේදී සැලකිල්ලට නොගැනීම.
- කල් පවත්නා ඇතැම් පරිභෝජන භාණ්ඩ ආයෝජනයක් ලෙස සලකා ජාතික ගිණුම් තුළ ඇතුලත් කිරීම.
- ජාතික ගිණුම් සැකසීමේ දී සැඟවුණු ආර්ථික කටයුතු හා නීත්‍යානුකූල නොවන ආර්ථික කටයුතු ඇතුළත් විය යුතු වුව ද තොරතුරු සැපයීම හා නීති-රීති මගහැරීම නිසා විධිමත් ගණනය කිරීමක් සිදු නොවේ.